# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022

2025 ජූලි

**සමාජීය විද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය**

(නව නිර්දේශය)

**මහජන සම්බන්ධතාව සහ මාධ්‍ය කළමනාකරණය**

**MACO 38214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "මහජන සම්බන්ධතාව යනු ආයතනයත් එහි මහජනතාවත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනැගීම සඳහා භාවිත කළ හැකි ක්‍රමයකි." නිර්වචන ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. මහජන සම්බන්ධතා නිළධාරියකු විසින් සිය සේවාදායකයා වෙනුවෙන් සිදුකරන සම්බන්ධතා කළමනාකරණ සේවාව ඉටුකිරීම සඳහා කළමනාකරණ නිපුණතා වැදගත් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 20)

03. දැන්වීම්කරණය සහ මහජන සම්බන්ධතාව යන ක්ෂේත්‍ර දෙක අතර පවතින වෙනස්කම් සහ ඒවායේ කාර්යභාරයන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

04. ජාත්‍යන්තර මාධ්‍ය වාර්තාකරණය රටක ප්‍රතිරූපය කෙරෙහි බලපාන්නේ කෙසේ ද? ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. මාධ්‍ය නියාමනය කිරීම, මහජන සම්බන්ධතා ක්‍රියාකාරිත්වයට සෘජුව බලපෑම් ලබයි. විවිධ නීතිමය තත්ත්වයන් ඇසුරෙන් විමසන්න. (ලකුණු 20)

06. සමාජ අලෙවිකරණය (Social Marketing) යන්න හඳුන්වා සමාජයට එය වැදගත් සංකල්පයක් වන්නේ කෙසේද යන්න විවිධ උදාහරණ අනුසාරයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. තෝරාගත් මාධ්‍ය ආයතනයකට, මහජන සම්බන්ධතා ක්‍රමෝපායක් ලෙස ආයතනික සමාජීය වගකීම (CSR) ඉටුකළ හැකි නිර්මාණශීලී වැඩසටහනක් සැලසුම් කරන්න. (ලකුණු 20)

08. තෝරාගත් මාතෘකා දෙකකට (02) සටහන් ලියන්න.

    i. මහජන සම්බන්ධතා ඉතිහාසය
    ii. මහජන සම්බන්ධතා ප්‍රභේද සහ විධික්‍රම
    iii. අවස්ථා ප්‍රභේද
    iv. මාධ්‍ය කළමනාකරණය
    v. සාම්ප්‍රදායික මාධ්‍ය ඩිජිටල්කරණය වීම (ලකුණු 10x2 =20)

******************************